අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

සියලු ම හිමිකම් ඇවිරිණි. All rights reserved. அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை

| කනිෂ්ඨ අංශය | බුද්ධි පරීක්ෂණය | කාලය පැය - 02 යි. |
|---|---|---|

- සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 25 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. 8 $ms^{-1}$ වේගයෙන් ගමන් කරන යතුරුපැදියකට 6km ගමන් කිරීමට ගත වන කාලය,
1) මිනි. 10 2) මිනි. 12.5 3) මිනි. 25 4) මිනි.15.5

02. අරය 70m වූ වෘත්තාකාර ක්‍රීඩාපිටියක් වටා 2m ක සමාන පරතරයක් සහිතව සිටුවීමට අවශ්‍ය කොඩි කණු ගණන,
1) 110 2) 220 3) 320 4) 140

03. පැත්තක දිග 70 m වූ සමචතුරස්‍රාකාර තහඩුවකින් කපා ගත හැකි විශාලතම වෘත්තයේ වර්ගඵලය,
1) 3800 $m^2$ 2) 3850 $m^2$ 3) 48000 $m^2$ 4) 4850 $m^2$

04. ළමයින් 8කගේ බරෙහි මධ්‍යන්‍යය 90kg වේ. එම පිරිසට 63 kg බර ළමයෙකු අලුතෙන් එකතු වූ විට නව මධ්‍යන්‍යය,
1) 153 kg 2) 17 kg 3) 729 kg 4) 87 kg

05. 60 $cm^3$ පරිමාවක් සහිත ලෝහ කුට්ටියක බර 600 g නම් එහි ඝනත්වය වන්නේ,
1) 10 $gcm^{-3}$ 2) 1200 $gcm^{-3}$ 3) 600 $gcm^{-3}$ 4) 60 $gcm^{-3}$

06. ඓක්‍යය 56 ද, ගුණිතය 300 ද වන සංඛ්‍යා 2හි අන්තරය වන්නේ,
1) 56 2) 300 3) 44 4) 50

07. 18 m දිග 12 m පළල ධර්ම ශාලාවක පොළව සම්පූර්ණයෙන් වැසෙන සේ ඇල්ලීමට අවශ්‍ය 50 cm × 50 cm ටයිල් කැට ගණන,
1) 54 2) 864 3) 432 4) 216

08. අමල් හා කමල් අතර 2:3 සේ ද, කමල් හා නිමල් අතර 2:3 වන සේ ද රුපියල් 19000ක් බෙදූ විට අමල් ලබන මුදල,
1) රුපියල් 1000 2) රුපියල් 4000 3) රුපියල් 6000 4) රුපියල් 9000

09. 1971.03.24 දින උපන් අයෙකුගේ 2025.06.01 දිනට වයස වන්නේ,
1) අවු. 54 මාස 2 දින 7 2) අවු.54 මාස 10 දින 7
3) අවු.96 මාස 10 දින 7 4) අවු. 54 මාස 2 දින 8

10. දිනකට නිවසකට අවශ්‍ය ලුණු ප්‍රමාණය 2.9 g නම් 2024 වර්ෂයට එම නිවසට වැයවූ ලුණු ප්‍රමාණය ආසන්න වශයෙන් කිලෝ ග්‍රෑම්,
1) 0.9 2) 1 3) 0.8 4) 365

11. මිනිසුන් අට දෙනෙකුට දින 9කදී නිමකළ හැකි කාර්යයක් දින 4කදී නිම කිරීමට අවශ්‍ය මිනිසුන් ගණන,

1) 18 2) 13 3) 72 4) 36

12. මිනිත්තු 30ට , 40ට හා 60 ට වරක් නාදවන ඔරලෝසු 3ක් එක වර උදේ අටට නාද වූයේ නම් නැවත එකවර නාදවන වේලාව,

1) උදේ 9.00 2) උදේ 10.00 3) උදේ 11.00 4) උදේ 11.30

13. ඝන ගෝලයක වර්ගඵලය 600 $cm^2$ නම් එම අරයම ඇති ඝන අර්ධ ගෝලයක වර්ගඵලය,

1) 300 $cm^2$ 2) 450 $cm^2$ 3) 200 $cm^2$ 4) 500 $cm^2$

14. දිග දම්වැලක 1,4,7 ආදි ලෙස එක ම රටාවකට පුරුක් පාට කර ඇත. අට වෙනියට පාට කර ඇත්තේ දම්වැලේ කවර පුරුක ද,

1) 22 2) 20 3) 18 4) 24

15. ගමනකින් 0.25 ගමන් කළ විට තවත් 30 km ඉතිරි වූයේ නම් ගමනේ මුළු දුර වන්නේ,

1) 10 km 2) 20 km 3) 30 km 4) 40 km

16. කමල් තම වැටුපෙන් $\frac{2}{5}$ක් තම වියදමට තබා ගෙන ඉතිරියෙන් $\frac{1}{3}$ ක් බිරිඳට දෙයි. ඉන් පසු අත ඉතිරි මුදල රුපියල් 40,000ක් නම් කමල්ගේ වැටුප වන්නේ රුපියල්,

1) 20,000 2) 40,000 3) 80,000 4) 100,000

17. රුපියල් 100ට ගත් භාණ්ඩයක් 10% ලාභ ලැබෙන සේ මිල ලකුණු කර අත්පිට මුදලට විකිණීමේ දී ලකුණු කළ මිලෙන් 10% ක වට්ටමක් ලබා දේ. භාණ්ඩයේ විකුණුම් මිල,

1) රුපියල් 100 2) රුපියල් 101 3) රුපියල් 99 4) රුපියල් 110

18. වර්ගඵලය 144 $cm^2$ සමචතුරස්‍රයක පරිමිතිය විය හැක්කේ,

1) 12 cm 2) 24 cm 3) 48 cm 4) 144 cm

19. ත්‍රිකෝණයක පාද 2ක් 5cm හා 12cm වේ. ත්‍රිකෝණයේ එක් කෝණයක් සෘජුකෝණයක් නම් දිග ම පාදයේ දිග විය යුත්තේ,

1) 12 cm 2) 17 cm 3) 13 cm 4) 7 cm

20. පැත්තක දිග 40 m සමචතුරස්‍ර ඉඩමක් වටා පිටතින් 1 m පළල පාරක් ඇත. පාරේ වර්ගඵලය වන්නේ,

1) 164 $m^2$ 2) 1600 $m^2$ 3) 1664 $m^2$ 4) 42 $m^2$

21. සිසුන් 7කගේ ලකුණු 8,7,3,2,6,8,5 වේ. ඉන් මධ්‍යස්ථ ලකුණ වන්නේ,

1) 5 2) 8 3) 6 4) 2

22. ත්‍රිකෝණයක අභ්‍යන්තර කෝණ අතර අනුපාතය 2 : 3 : 1 වේ. විශාල ම කෝණයේ අගය වන්නේ,

1) $30^\circ$ 2) $60^\circ$ 3) $90^\circ$ 4) $120^\circ$

23. A ළඟ ඇති මුදල B ළඟ ඇති මුදල මෙන් දෙගුණයකි. A ගෙන් රුපියල් 60ක් B ට දුන් විට දෙදෙනා ළඟ මුදල් ප්‍රමාණ සමාන වේ. A ළඟ මුලින් තිබූ මුදල,

1) රුපියල් 120 2) රුපියල් 240 3) රුපියල් 180 4) රුපියල් 360

24. $x + \frac{1}{x} = 9$ නම්, $x^2 + \frac{1}{x^2}$ හි අගය,

1) 81 2) 18 3) 79 4) 19

25. ජලය පිරී ඇති බඳුනකට ලෝහ ඝනකයක් සෙමින් ඇතුළු කළ විට ජලය 216ml ප්‍රමාණයක් පිටාර ගියේය. ඝනකයේ පැත්තක දිග විය හැක්කේ,

1) 12 cm 2) 36 cm 3) 6 cm 4) 9 cm